# ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය - 2019

-----------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක්ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේ දී වටිනාකම රු. 173,153,909 ක ඉඩම් සඳහා ඉඩම් පැවරීමේ සහතික ලබා දී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී එම ඉඩම්වල වටිනාකම ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කරනු වෙනුවට අත්තිකාරම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිලියෙල කරන අවස්ථාව වනවිට මෙම ව්‍යාපෘතිය අවසන් කර ඇති බවට ලිඛිත තහවුරු කිරීම් අදාල අංශය විසින් මූල්‍ය අංශය වෙත ලබාදී නොමැති බැවින් ඒ පිළිබඳ ගිණුම් තබා නොමැත. | ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කල යුතු බව. |
| (ආ) කල්පිටිය සංචාරක සංවර්ධන කලාපය සඳහා ඉඩම් අත්පත් කර ගැනිමට ගෙවූ අත්තිකාරම් මුදල මූල්‍ය ප්‍රකාශන අනුව රු. 61,314,891 ක් වුවත්, ප්‍රාදේශීය ලේකම් විසින් එවන ලද ශේෂ සනාථ කිරීමට අනුව රු.69,234,427 ක් විය. මේ අනුව රු.7,919,536 වෙනසක් නිරීක්ෂණය විය. | 2018 හා 2019 වර්ෂයන් සඳහා පොලී ආදායම් ඉහත ශේෂයට ගලපා නොමැති බැවින් මෙම වෙනස පෙන්නුම් කරයි. අත්තිකාරම් මත පොලී ආදායම අධිකාරියට ලැබීම පිළිබඳ ලිඛිත තහවුරුවක් අදාල අංශය විසින් නොලැබුණු බැවින් පොලී ආදායම ගිණුම් තබා නොමැත. | වෙනස හඳුනාගෙන නිවැරදිව ගිණුම් පිලියෙල කල යුතු බව. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයෙන් ලැබිය යුතු දුරකථන/ සනීපාරක්ෂක හා ආරක්ෂණ ගාස්තු රු. 33,267,512 ක් වුවත්, කාර්යංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය රු. 53,531,048 ක් වීමෙන් රු. 20,263,536 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉක්මනින් ශේෂ සැසඳුමක් සිදුකරන අතර නොසැඳුන ශේෂ ඇතොත් ඉහල කළමනාකරණයේ මහපෙන්වීම යටතේ නිරවුල් කිරීමට කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරයි. | අදාල ශේෂයන් සසඳා ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කල යුතු බව. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සංචාරක සංවර්ධන අරමුදලෙන් ලැබිය යුතු පරිපාලන වියදම රු. 193,899 ක් වුවත්, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු ශේෂය රු. 1,245,082 ක් වීමෙන් රු.1,051,183 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2019 දෙසැම්බර් 31 දිනට සංචාරක සංවර්ධන ලැබිය යුතු බදු මුදලින් සියයට 0.5 ගණනය කොට ලැබිය යුතු පරිපාලන වියදම් රු.193,899 ක් ගිණුම් ගත කර ඇත. | ලැබිය යුතු ගෙවිය යුතු ගිණුම් අතර වෙනස නිවැරදි කල යුතු බව. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) ආයෝජන | 54,640,268 | ආයෝජන සහතික හෝ වෙනත් ලිඛිත සාක්ෂි | මෙම ශේෂයන් පොත්වලින් ඉවත් කිරීමට පියවර ගනු ලැබේ. | අදාළ සාක්ෂි මගින් තහවුරු කළ යුතු බව. |
| (ආ)ලැබියයුතු ශේෂ | 340,712,192 | ශේෂ සනාථ කිරීමේ ලිපි | ණයගැතියන්ගේ ශේෂ සනාථ ලැබෙමින් පවතී. ශේෂයන් විශ්ලේෂණය කර අදාල ශේෂ තහවුරු ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ සනාථ කිරීම ඉදිරිපත් කළ යුතු බව. |
| (ඇ) අත්තිකාරම් | 1,358,900 | ශේෂ සනාථ කිරීමේ ලිපි | අත්තිකාරම්වලට අදාල ශේෂ ලැයිස්තුව ඉදිරිපත් කර ඇත. | ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයෙන් ලැබිය යුතු ලෙස දක්වා ඇති රු.108,391,047 ක ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්ම වූ ශේෂය රු.28,742,857 ක් විය. | ශේෂයේ ඇතුලත් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලිය රු.75,123,535 ක් මේ දක්වා ලැබී නොමැති අතර ශේෂයන් සසඳා ඒවා නිරවුල් කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා කරයි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට වෙළද ණයගැතියන් ලෙස දක්වා ඇති රු.101,717,640 ක් ශේෂයෙන් වර්ෂ 04 කට වැඩි ශේෂය රු.26,386,007 ක් විය. තවද, රදවා ගත් මුදල් ශේෂය රු.40,670,458 තුල වර්ෂ 04 කට වැඩි රු. 15,566,948 ක ශේෂයක්ද පැවති බැවින් එම ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ පාස්කු සිදුවීමෙන් පසු මේ වන තෙක් ණයගැති සහන කාලයක් ලබාදී ඇති නිසා ණය අයකර ගැනීම අපහසු වී ඇත. රදවාගත් ශේෂයෙන් වර්ෂ 4ට වැඩි ශේෂය පොත්වලින් ඉවත් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | ශේෂයන් නිරවුල් කර ගත යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු තැන්පතු රු. 9,441,582 ක ශේෂයෙහි 1989 ට පෙර සිට 2007 වර්ෂය දක්වා විදේශයන්හි කාර්යාල සඳහා කුලී වෙනුවෙන් තැන්පත් කරන ලද රු.3,536,671 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු තැන්පත් ගිණුමේ ඇති විදේශයන්හි කාර්යාල සඳහා කුලී වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල් පිළිබඳ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සමඟ සාකච්ඡා කිරීමට සහ රදවා ගැනීමේ බදු වශයෙන් තබා ඇති වටිනාකම පිළිබඳව සොයා බලා සුදුසු ක්‍රියා මාර්ග ගනු ලැබේ. | ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-----------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ IVපරිච්ඡේදයේ 26(3) උප වගන්තිය | ප්‍රකාශිත යම් සංචාරක සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත කරගෙනයාහැකි සංචාරක කටයුතු, වාණිජ සහ වෙනත් කටයුතු නියම කරමින් නියෝග සාදා නොතිබුණි. | වලංගුව පවත්නා සංචාරක සංවර්ධන ප්‍රදේශ සඳහා සංචාරක කටයුතු වානිජ්‍ය හා වෙනත් කටයුතු පිළිබඳ තොරතුරු රැස් කරමින් පවතින අතර ඒ සඳහා අදාල වන නියෝග 2020 වසර අවසන් වනවිට කෙටුම්පත් කිරීමට සැලසුම් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 757 | වටිනාකම රු.1,880,781ක්වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පුස්තකාල පොත් හිමිකම ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මගින් ලබා ගෙන නඩත්තු කරන බැවින් එම ආයතනය වෙත පැවරීමට කටයුතු කරනු ලැබේ. | රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2010 පෙබරවාරි 09 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය | අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් අවශ්‍ය සේවා පලපුරුද්ද සපුරා නොමැති නිලධාරිනියක පත් කර 2016 මැයි 02 දින සිට 2019 දෙසැම්බර් දක්වා වැටුප් හා විවිධ දීමනා වශයෙන් රු. 8,196,756 ක් ගෙවා තිබුණි. | අදාල නිලධාරිනියගේ දැනුම, පළපුරුද්ද, අවබෝධය, අඩු උපදෙසකින් රාජකාරී කිරීමට ඇති හැකියාව ස්ව අභිප්‍රේරණය හා කැපවීමෙන් කටයුතු කිරීම හේතුවෙන් ඇයගේ සේවය ඉතා වැදගත් වන අතර, ඉදිරියටත් ඇයගේ සේවය ආයතනයේ කළමණාකාරීත්වය අපේක්ෂා කරයි. | බඳවා ගැනීමේ පටිපාටියට අදාල සුදුසුකම් සපුරා තිබිය යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.119,458,429 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 280,425,355 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 160,966,926 ක පිරිහීමක් නිරීක්ෂණය විය. බලපත්‍ර ගාස්තු ආදායම් රු. 55,554,696 කින් වැඩි වුවද අපගමන බදු ආදායම රු.102,994,589 කින් අඩුවීම, වෙළඳ වියදම් රු. 22,983,113 කින් වැඩි වීම සහ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම් රු.31,333,786 කින් වැඩි වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ පූර්ව ශක්‍යතා අධ්‍යයනකින් තොරව ආරම්භ කර තිබූ කැලිඩෝ වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී අතරමඟ නවතා තිබූ අතර ඒ සඳහා ගෙවූ අත්තිකාරම් රු.19,990,021 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කළුතර කැලිඩෝ වෙරළ උද්‍යාන ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේදී රු.19,990,021 ක අත්තිකාරමක් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයවෙත ලබා දී තිබූ අතර ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී නැවතී ඇත. 2014 වර්ෂයේදී අධිකාරිය පරිශ්‍රයේ ගොඩනැගිලි නවීකරණය සඳහා රු.මිලියන 26.186 ක් මධ්‍යම ඉංජිනේරු කාර්යාංශයට ගෙවිය යුතුව ඇති අතර එහි ප්‍රාග්ධන වියදම රු. මිලියන 4 කට ආසන්න මුදලක් හැර ඉතිරිය කැලිඩෝ ව්‍යාපෘතියේ මූල්‍ය වලින් හිලව් කලයුතු බව මධ්‍යම ඉංජිනේරු කාර්යාංශය දැනුම් දී ඇත. | අදාල අත්තිකාරම් මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු බව. |